**`ඇමුණුම I**

# 2023 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

## ආයතනයේ නම - ප්‍රධාන අමාත්‍යාංශය

## වැය ශීර්ෂ අංකය - 610

**අන්තර්ගතය**


පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

පරිච්ඡේදය 04 - කාර්යසාධන දර්ශක

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

පරිච්ඡේදය - 01

## 1.1 ආයතනය පිළිබඳ හැඳින්වීම:

උතුරුමැද පළාතේ තිරසර සංවර්ධනයේ පෙරගමන්කරු වශයෙන් පළාතේ ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමෙහිලා ඉතා සුවිශේෂී කාර්යභාර්යක් ඉටුකරමින් සමානාත්මතාවයෙන් යුතු සේවයක් සැලසීම අමාත්‍යාංශයේ වගකීම ලෙස සලකා කටයුතු කරනු ලබයි.

1987, 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පළාත් සභා පිහිටුවීමට මධ්‍යම රජයෙන් ගන්නාලද තීරණ මත 1988 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද පළාත් සභා ක්‍රමය යටතේ පැවරී ඇති බලතල සීමාව තුළ ප්‍රධාන අමාත්‍යාංශය ලෙස පළාතේ නීතිය හා සාමය, මුදල් හා ක්‍රමසම්පාදන, පළාත් පාලන, ග්‍රාමීය යටිතල පහසුකම්, විශේෂ ව්‍යාපෘති, සංචාරක, අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ, ඉංජිනේරු ඉදිකිරීම් සහ සංස්කෘතික යන විෂයන්ගේ කළමනාකරණ, පරිපාලන හා නියාමන වගකීම උසුලනු ලැබේ.

අමාත්‍යාංශයට අයත් ආයතන අතරින් ප්‍රධානතම ආයතන ලෙස පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සහ පළාත් පාලන දෙපාර්තමේන්තුව නම් කළ හැකි අතර පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව ද ප්‍රධාන අමාත්‍යාංශයට අයත් වේ.

උතුරුමැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය යටතේ පරිපාලනය වන්නා වූ ව්‍යවස්ථාපිත ආයතන 03 ක් ක්‍රියාත්මත වේ. 1990 අංක 11 දරණ උතුරුමැද පළාත් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය පිහිටුවිම පිළිබඳ වූ ප්‍රඥප්තියට අනුකූලව ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය පිහිටුවා ඇත. 2002 අංක 04 දරණ ප්‍රඥප්තිය හා 2009 අංක 04 දරණ සංශෝධිත ප්‍රඥප්තිය යටතේ පුස්තකාල සේවා මණ්ඩලය පිහිටුවා ඇත. 2003 අංක 04 දරණ පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරි ප්‍රඥප්තිය යටතේ පූර්ව ළමාවිය සංවර්ධන අධිකාරිය පිහිටුවා ඇත.

මීට අමතරව සංචාරක, බලශක්ති, ආගමික කටයුතු, ග්‍රාමීය යටිතල පහසුකම්, ජීවනෝපාය සංවර්ධනය යන විෂයන්ට අයත් සියළු කටයුතු අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. ඒ අනුව අමාත්‍යාංශයේ අරමුණු හා ප්‍රධාන කාර්යයන් ඉහත සියළු විෂයන්ට අදාළ ආයතන සම්බන්ධීකරණය, සංවර්ධනය මෙහෙයවීම හා මූල්‍ය කළමනාකරණයට අදාළව ගොණුවී ඇත.
උතුරුමැද පළාතේ ජනතාවගේ ජීවන ක්‍රමයට සෘජුවම සහ වක්‍රව බලපාන සේවාවන් සපයමින් පළාතේ ජන ජීවිතයට ඉතා සමීපව ක්‍රියාත්මක වන අමාත්‍යාංශය බවට ප්‍රධාන අමාත්‍යාංශය පත්ව තිබේ.

## 1.2. ආයතනයේ දැක්ම: යහපත් සමාජයක්, සෞභාග්‍යමත් පළාතක්.

**මෙහෙවර:**

සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව පළාත් පාලනය, ග්‍රාමීය යටිතල පහසුකම්, ආගමික කටයුතු, විකල්ප බලශක්ති, ජනමාධ්‍ය හා සන්නිවේදනය, පුස්තකාල, මුද්‍රණ හා තාක්ෂණික සේවා, ජනතා සුභසාධනය හා සවිබල ගැන්වීම, සංචාරක, අධ්‍යාපන, සංස්කෘතික, මුල් ළමාවිය අධ්‍යාපන කටයුතු සංවර්ධනය කිරීම සහ පළාතේ තොරතුරු තාක්ෂණය ප්‍රවර්ධනය කිරීම.

**ආයතනික අරමුණු:**

1. ජාතික හා පළාත් දැක්මට අනුගත වෙමින් අමාත්‍යංශය යටතේ පවතින දෙපාර්තමේන්තු හා ආයතන සඳහා අවශ්‍ය මඟපෙන්වීම හා නියාමනය.

2. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය, සම්බන්ධීකරණය හා ප්‍රගති සමාලෝචනය හා පසුවිපරම් කිරීම.

3. විවිධ මූලාශ්‍ර ඔස්සේ පළාතේ මහ ජනතාවගෙන් ලැබෙන පැමිණිලි සඳහා විමර්ශන වාර්තා ලබා ගනිමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

4. පළාතේ තිරසාර සංවර්ධනයක් උදෙසා ආයතන මට්ටමෙන් අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

5. අමාත්‍යංශයේ, දෙපාර්තමේන්තුවේ හා ආයතන වල කාර්ය මණ්ඩලයේ සේවා කොන්දේසි ඉටුකිරීම.

## 1.2 ආයතනයේ ප්‍රධාන කාර්යයන්

1. පළාතේ ප්‍රාථමික, ද්විතීක හා පූර්ව ළමාවිය අධ්‍යාපන සංවර්ධනය සඳහා භෞතික සහ ගුණාත්මක අධ්‍යාපනික යටිතල පහසුකම් සංවර්ධනය

2. පළාතේ පළාත් පාලන ආයතන සේවා නියාමනය හා මඟපෙන්වීම

3. පළාතේ සංචාරක කටයුතු සංවර්ධනය

4. නීතිය හා සාමය පවත්වාගෙන යාමට විධිවිධාන යෙදීම

5. ආයතනික ධාරිතා සංවර්ධනය

6. අමාත්‍යංශය යටතේ ඇති ආයතන සම්බන්ධීකරණය හා සංවර්ධනය හා නියාමනය

7. පළාතේ ආගමික හා සංස්කෘතික කටයුතු සංවර්ධනය

8. පළාතේ යටිතල පහසුකම් සංවර්ධනය හා ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය


9. පුස්තකාල සේවාවන් හා තොරතුරු තාක්ෂණ සේවා වැඩිදියුණු කිරීම

10. පරිසර හිතකාමී විකල්ප බලශක්ති ක්‍රමවේදයක් ලෙස සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන යෙදවුම් ප්‍රවර්ධනය කිරීම හා එමගින් ජාතික විදුලිබල පද්ධතියට යම් දායකත්වයක් ලබාදීම

11 සමාන්‍ය පරිපාලනය හා අධීක්ෂණය

12. යහපාලනය

## 1.1. සංවිධාන සටහන



අමාත්‍යාංශ ලේකම්
අධ්‍යක්ෂ (සැලසුම්-01)
අධ්‍යක්ෂ (සැලසුම්-02)
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්(පාලන)
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්(අධ්‍යාපන)
ප්‍රධාන ගණකාධිකාරී
ප්‍රධාන ගණකාධිකාරී (අධ්‍යාපන)
සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්)
සහකාර ලේකම්
ගණකාධිකාරී 111/11 පංතිය
සංවර්ධන නිළධාරී
කාර්යාල කාර්ය සහයක
පරිපාලන නිළධාරී
සංවර්ධන නිළධාරී
කළමනාකරණ සහකාර
රියදුරු
කාර්යාල කාර්ය සහයක
සංචාරක බංගලා භාරකරු
කැමරා ශිලිපි
පටිගත කිරීමේ ශිල්පී
සංවර්ධන නිළධාරී
කළමනාකරණ සහකාර
කාර්යාල කාර්ය සහයක
සංවර්ධන නිළධාරී
කළමනාකරණ සහකාර
කාර්යාල කාර්ය සහයක

**1.5. ආයතනය යටතේ ඇති දෙපාර්තමේන්තු, අධිකාරි සහ වෙනත් උප කාර්යාල**

- **පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
- **පළාත් පාලන දෙපාර්තමේන්තුව**
- **පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව**

වයවස්ථාපිත ආයතන

- **සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය**
- **පුස්තකාල සේවා මණ්ඩලය**
- **මුල් ළමාවිය සංවර්ධන අධිකාරිය**

**1.6 ප්‍රතිපාදන මූලාශ්‍ර**

**පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන**

**පළාත් සභා සංවර්ධන ප්‍රදාන**

**සාමූහික ප්‍රදාන**

**1.7. විදේශ ආධාර ව්‍යාපෘති - නැත**

**අ) ව්‍යාපෘතියේ නම**

**ආ) දායක නියෝජිතායතනය**

**ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේනතුගත වියදම - රු.මි**

**ඈ) ව්‍යාපෘති කාල සීමාව**

**පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම**

2023 වර්ෂයේ රටේ ඇතිවුණු ආර්ථික අර්බුදය නිසා රාජ්‍ය වියදම් පාලනය කිරීමක් සිදුකරන ලදී. ගරු ආණ්ඩුකාරතුමා විසින් 2023 වර්ෂය සඳහා අනුමත කරන ලද වාර්ෂික මුදල් ප්‍රකාශය මගින්

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ අමාත්‍යාංශය වෙත වෙන්කරන ලද ප්‍රතිපාදන පහත පරිදි සංශෝධනය කරන ලදී. එමෙන්ම මහාභාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ 2023/01, 2023/01 හා 2022.04.06 දිනැති චක්‍රලේඛය අනුව රාජ්‍ය වියදම් පාලනය කිරීමක් ද සිදුවිය. ඒ අනුව නව ව්‍යාපෘති ආරම්භ කිරීම අධෛර්යමත් කිරීම සිදුවිය.

| | සංරචකය | 2023 මුදල් ප්‍රකාශය මගින් වෙන්කරන ලද ප්‍රතිපාදන (රු.) | අවසන් සංශෝධිත මුළු ප්‍රතිපාදන (රු.) |
|---|---|---|---|
| 01 | අධ්‍යාපන සේවා | 260,000,000 | 60,000,000 |
| 02 | සංස්කෘතික හා ආගමික කටයුතු | 14,000,000 | 7,000,000 |
| 03 | මුල් ළමාවිය සංවර්ධනය | 6,000,000 | - |
| 04 | ග්‍රාමීය විදුලිය | 11.000,000 | - |
| 05 | සංචාරක | 35,000,000 | 651,360 |
| 06 | පළාත් පාලන | | |
| | පළාත් පාලන මාර්ග | 100,000,000 | 36,700,000 |
| | ප්‍රජා ජල සැපයුම් | 40,000,000 | 3,800,000 |
| | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | 20,000,000 | 20,000,000 |
| | වෙනත් සේවා | 35,000,000 | 35,000,000 |
| | උප එකතුව | **521,000,000** | **163,151,360** |
| | **අමාත්‍යාංශීය කටයුතු** | 2,500,000 | 2,000,000 |
| | ජීවනෝපාය සංවර්ධනය | 10,000,000 | - |
| | පුස්තකාල සේවා | 3,000,000 | 103,000 |
| | මුල් ළමාවිය සංවර්ධනය | 1,000,000 | 300,000 |
| | උප එකතුව | **16,500,000** | **1,403,000** |
| | එකතුව | **537,500,000** | **164,554,360** |

ඒ අනුව 2022 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතිවල අතැති බිල්පත් සහ අවිච්ඡේද ව්‍යාපෘති සඳහා ගෙවීම් කරන ලද අතර නව සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා තෝරාගත් අය සඳහා පමණක් සීමිත ප්‍රතිපාදන වර්ෂයේ 4වන කාර්තුවේදී ලබා දෙන ලදී.

## සංරචකය අනුව ප්‍රගතිය - 2023

| මූලාශ්‍ර ප්‍රභවය | විස්තරය | අනුමත මුළුමුදල (රු.මි.) | ව්‍යාපෘති ගණන | 100% වැඩ අවසන් ව්‍යාපෘති | අතැති බිල්පත් (රු.මි.) | | අවිච්ඡේද (රු.මි) | | නව ව්‍යාපෘති (රු.මි.) | | 2024 වර්ෂයේ ගෙවිය යුතු මුදල (රු.මි.) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | වටිනාකම | වියදම | වටිනාකම | වියදම | වෙන් කළ මුදල | වැය කළ මුදල | අතැති බිල්පත් වටිනාකම | අවිච්ඡේද වටිනාකම |
| PSDG | අධ්‍යාපන | 101.113 | | | | | | | | | | |
| | ඉදිකිරීම්, අළුත්වැඩියා | | 27 | 24 | | | | | 55.353 | 51.777 | | - |
| | ගුණාත්මක යෙදවුම් | | 2 | 2 | | | - | - | 4.467 | 4.419 | - | - |
| | | | | | | | | | | | | |
| | ඉදිකිරීම්, අළුත්වැඩියා | | 17 | 17 | 21.159 | 17.077 | 19.954 | 19.110 | | | | 3.667 |
| | | | 46 | 43 | 21.159 | 17.077 | 19.954 | 19.110 | 59.82 | 56.196 | | |
| PSDG | සංචාරක | 1.064 | 1 | 1 | - | - | 0.413 | | | | | - |
| | | | 1 | 1 | - | - | | | 0.651 | 0.628 | | - |
| | | | 2 | 2 | - | - | | | | | | - |
| PSDG | සංස්කෘතික කටයුතු | 7 | 1 | 1 | | | | | 7 | 6.713 | | |
| PSDG | පළාත් පාලන කටයුතු | | | | | | | | | | | 0.544 |
| | අතැති බිල් | 9.999 | 9 | 9 | 9.999 | 3.521 | | | | | | |
| | මාර්ග | 36.7 | 28 | 4 | | | | | 36.7 | 5.873 | | |
| | ජල පහසුකම් | 3.8 | 5 | 1 | | | | | 5 | 5 | | |
| PCDG | අමාත්‍යාංශ කටයුතු | 2.1 | 1 | 1 | .0.092 | 0.092 | 0.413- | - | 0.651 | 0.628 | - | - |
| | | | 3 | 3 | | | - | | 2 | 1.802 | | |
| | | | 4 | 4 | 0.092 | 0.092 | - | - | 2 | 1.802 | - | - |
| | පුස්තකාල සේවා මණ්ඩලය | 0.1 | 1 | 1 | | | | | 0.1 | 0.06 | | |

## අධ්‍යාපන

2023 වර්ෂයේ උතුරු මැද පළාතේ දරුවන්ට නිදහස්, සමාන හා ගුණාමකභාවයෙන් ඉහළ ප්‍රාථමික සහ ද්විතියික අධ්‍යාපනයක් ලබාදීම වෙනුවෙන් රු.මි. 60 ක් වෙන්කරන ලදී. එයින් 2022 වර්ෂයේ සංවර්ධන ව්‍යාපෘති 41ක 100% ක් වැඩ අවසන්කර ගෙවිය යුතු අතැති බිල්පත් වල වටිනාකම රු.මි. 21.16 වු අතර එයින් රු.මි. 17.07 ක් ගෙවන ලදී. 2022 වර්ෂයෙන් 2023 වර්ෂයට සංවර්ධන ව්‍යාපෘති 02ක් අවිච්ඡේද ව්‍යාපෘති වශයෙන් අනුමත කරන ලදී. එම ව්‍යාපෘති වල භෞතික ප්‍රගතිය 100%කි.

එහි අවිච්ඡේද වැඩ වටිනාකම රු.මි. 19.95ක් වු අතර එයින් රු.මි. 19.11 ක් වැය කරන ලදී. ඒ යටතේ පන්තිකාමර ගොඩනැගිල්ලි 2ක් ඉදි කරන ලදී. තවද 2023 වර්ෂයේ නව අධ්‍යාපන ඉදිකිරීම් හා අවිච්ඡේද ව්‍යාපෘති 26 ක වැඩ සම්පූර්ණයෙන්ම අවසන් කරන ලදී. ඒ සඳහා රු.මි.56.20 ක් ගෙවීම් කර ඇත.

## සංචාරක

උතුරුමැද පළාතේ සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා රු.මි. 01 ක් වෙන්කරන ලදී. එයින් නව ව්‍යාපෘති සඳහා රු.මි. 0.63ක් ගෙවන ලදී. ඒ යටතේ සංචාරක කටයුතු සංවර්ධනය සඳහා වීඩියෝ දර්ශන නිර්මාණය කරනලදී. .

## සංස්කෘතික කටයුතු

සංස්කෘතික කටයුතු සංරචකය යටතේ නව ව්‍යාපෘති සඳහා රු.මි. 7.0ක් වෙන්කළ අතර ඒ සඳහා රු.මි. 6.7ක් වැය කරන ලදී. ඒ අනුව අදාළ වියදම් දරා උත්කර්ෂවත් අයුරින් උතුරුමැද පළාත් කළා උළෙල පවත්වන ලදී.

## මුල් ළමාවිය සංවර්ධනය

මුල් ළමාවිය සංවර්ධනය සඳහා නව ව්‍යාපෘති යටතේ රු.මි. 1.3ක් වෙන්කර තිබූ අතර අදාළ ප්‍රතිපාදන පූර්ව ළමාවිය සංවර්ධන අධිකාරි වෙත ලබාදී ඇත. එහි කාර්යසාධනය එම ආයතනය යටතේ ඉදිරිපත් කර ඇත.

## පළාත් පාලන දෙපාර්තමේන්තුව

පළාත් පාලන මාර්ග, ප්‍රජා ජල සැපයුම් සේවා වෙනුවෙන් වෙන්වූ රු.මි. 41 ක් ප්‍රතිපාදන පළාත් පලාන දෙපාර්තමේන්තුව වෙත ලබාදී ඇත. අදාළ දෙපාර්තමේන්තුව යටතේ එහි කාර්යසාධනය ඉදිරිපත්කර ඇත.

## පුස්තකාල සේවා මණ්ඩලය

පුස්තකාල සේවා මණ්ඩලය සඳහා රු.මි.0.01 ක් වෙන්වූ අතර එම ප්‍රතිපාදන පුස්තකාල සේවා මණ්ඩලය වෙත ලබාදී ඇත. එහි කාර්යසාධනය එම ආයතනය යටතේ ඉදිරිපත් කර ඇත.

## අමාත්‍යාංශ කටයුතු

අමාත්‍යාංශ කටයුතු සඳහා රු.මි.2.09 ක් වෙන්කළ අතර අතැති බිල්පත් සඳහා රු.මි.0.09 ක් වැය කළ අතර නව ව්‍යාපෘති සඳහා රු.මි.1.8 ක් ගෙවීම් කර ඇත.

යහපත් සමාජයක්, සෞභාග්‍යමත් පළාතක් ගොඩනැගීමේ දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා විවිධ සංරචක ඔස්සේ 2024 වසර තුළ ද මෙම අමාත්‍යංශය මගින් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර ඒ සඳහා රු. මි. 859 ක් වෙන්කර ඇත.

## 2024 සංවර්ධන වැඩසටහන සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම

| | සංරචකය | 2024 වෙන් වූ ප්‍රති පාදන (රු.මි.) |
|---|---|---|
| | **PSDG** | |
| 1. | අධ්‍යාපන | 388.0 |
| 2. | පළාත් පාලන | |
| | පළාත් පාලන මාර්ග | 150.0 |
| | ප්‍රජා ජල සැපයුම | 60.0 |
| | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | 30.0 |
| | වෙනත් සේවා | 50.0 |
| 3. | සංස්කෘතික හා ආගමික කටයුතු | 21.0 |
| 4. | සංචාරක | 53.0 |
| 5. | ග්‍රාමීය විදුලිය | 17.0 |
| 6. | පූර්ව ළමාවිය සංවර්ධනය | 10.0 |
| | උප එකතුව | 779.0 |
| | **PCDG** | |
| 1. | අමාත්‍යාංශීය කටයුතු | 4.5 |
| 2. | ජීවනෝපාය සංවර්ධනය | 25.0 |
| 3. | පුස්තකාල සේවා | 17.0 |
| 4. | පූර්ව ළමාවිය සංවර්ධනය | 5.0 |
| 5. | සංස්කෘතික හා ආගමික කටයුතු | 28.5 |
| | උප එකතුව | 80.0 |
| | **එකතුව** | **859.0** |

ඒ අනුව අධ්‍යාපනික සංවර්ධනය තුලින් ගුණාත්මක  භාවයෙන් යුක්තව පළාතේ දරුවන් සඳහා ඵලදායි අධ්‍යාපන සේවාවන් සැපයීමට යෝග්‍ය වූ ආයතනයක් ලෙස පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව නියාමනය කිරීම ප්‍රධාන අරමුණ කරගෙන ප්‍රාථමික  අධ්‍යාපනය වැඩිදියුණු කිරීම, ද්විතියික අධ්‍යාපනය වැඩිදියුණු කිරීම, කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීම, ගුණාත්මක සංවර්ධනය වැඩිදියුණු කිරීම වැනි ප්‍රධාන ක්‍රියාකාරකම් අනුව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා පහසුකම් සැපයිම, භෞතික සහ යටිතල පහසුකම් සැපයීම, මානව සම්පත් සංවර්ධනය සඳහා යෝග්‍යවූ ආයතනයක් ලෙස ක්‍රමවත් කිරීම සඳහා රු. මි. 388 ක් අධ්‍යාපනය සංවර්ධනය වෙනුවෙන් වැය කිරීමට අපේක්ෂා කෙරේ.

පළාත් පාලන දෙපාර්තමේන්තුව සඳහා ග්‍රාමීය මාර්ග සංවර්ධනය, ප්‍රජා ජල සැපයුම් සංවර්ධනය, ග්‍රාමීය ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සහ වෙනත් පළාත් පාලන සේවා කටයුතු සංවර්ධනය සඳහා රු.මි. 290 ක් වෙන් කර ඇත.

පළාතේ සංස්කෘතික හා ආගමික කටයුතු වෙනුවෙන් රු.මි. 28.5 ක් වෙන්කර ඇති අතර ඒ යටතේ පළාතේ ආගමික ස්ථාන සංවර්ධනය, දහම් පාසල් සංවර්ධනය හා උතුරු මැද පළාතේ අංකුර කලාකරුවන්ගේ දක්ෂතාවයන් එළිදැක්වීම සඳහා වාර්ෂිකව සංවිධානය කරනු ලබන කලා උළෙල පැවැත්වීමට අපේක්ෂා කෙරේ.

උතුරු මැද පළාතේ සංචාරක ක්ෂේත්‍රයේ දියුණුව උදෙසා 2024 වර්ෂයේ සංචාරක කර්මාන්තය ආශ්‍රිතව යටිතල පහසුකම් සංවර්ධනය, සංචාරක කර්මාන්තයේ නියැලෙන පාර්ශවකරුවන්ගේ ධාරිතා සංවර්ධනය හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සංචාරක තොරතුරු මධ්‍යස්ථානය සංවර්ධනය, උතුරුමැද පළාතට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින් සඳහා අවශ්‍ය පහසුකම් සැපයිමට අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතින් ක්‍රියාත්මක කිරීම උදෙසා රු. මි. 53 ක් වෙන්කර ඇත.

ග්‍රාමීය විදුලි සංරචකය යටතේ උතුරු මැද පළාතේ විශේෂයෙන් විදුලි පහසුකම් නොමැති ප්‍රදේශ ඉලක්ක කර  ග්‍රිමීය ◌ිදුලි යෝජනා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම උදෙසා  රු.මි.8 ක් වෙන්කර ඇති අතර ඒ යටතේ පළාත් පාලන ආයතන මට්ටමින් තෝරාගත් පොදු ස්ථාන සහ තෝරාගත් ආකර්ශනිය සහිත ආගමික, සංචාරක හා පුරාවිද්‍යා ස්ථානවල සූර්ය වීථි ලාම්පු ස්ථානගත කිරීම සහ ග්‍රාමීය ප්‍රදේශවල විදුලි යෝජනා ක්‍රියාත්මක කිරීමට ද නියමිතය.

පූර්ව ළමාවිය සංවර්ධනය සඳහා රු.මි. 15 ක් වෙන්කර ඇති අතර ඒ යටතේ පූර්ව ළමා විය සංවර්ධන අධිකාරිය යටතේ පෙර පාසල් සංවර්ධනය, පෙර පාසල් සඳහා උපකරණ ලබාදීම සහ පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමා හා සහතික පත්‍ර පාඨමාලා පැවැත්වීම හා පෙර පාසල් ගුරු වරියන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීමටත් අපේක්ෂා කෙරේ.

පුස්තකාල සේවා මණ්ඩලය සඳහා රු.මි. 17 ක් වෙන්කර ඇති අතර ඒ යටතේ ස්වයං නිර්මාණ මිලදීගැනීම, නව ලේඛකයන් සඳහා මුද්‍රාණාධාර ලබාදීම, නිර්මාණ තරඟ පැවැත්වීම, පුහුණු වැඩසටහන් පැවැත්වීම, පොත් මිලදීගැනීම, තරඟ සංවිධානය කිරීම, දත්ත පද්ධතියක් සැකසීම ආදිය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

අමාත්‍යාංශීය කටයුතු සඳහා රු.මි. 4.5 ක් වෙන්කර ඇති අතර ඒ යටතේ නිල නිවාස හා වාහන අලුත්වැඩියාව සහ ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනීම සහ දැනුම වර්ධනය හා ආයතනික සංර්ධන කටයුතු කිරීමට අපේක්ෂා කෙරේ.

පළාතේ ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම අරමුණු කරගෙන ජීවනෝපාය සංවර්ධන සංරචකය යටතේ ආදායම් උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි.25 ක් වෙන්කර ඇත. ඒ යටතේ අඩු ආදායම්ලාභී ස්වයං රැකියාවල නියුතුවුවන් සහ නිරතවීමට අපේක්ෂිත ව්‍යවසායකයින් සඳහා 50% ප්‍රතිලාභීදායකත්වය මත ස්වයං රැකියා උපකරණ ලබාදීම, වකුගඩු රෝගයෙන් පෙළෙන පවුලවල ආර්ථික තත්ත්වය නඟා සිටුවීම සඳහා 40% ප්‍රතිලාභීදායකත්වය මත ස්වයං රැකියා උපකරණ ලබාදීම සහ කාන්තා මුලික පවුල්වල කාන්තාවන්ගේ ජීවනෝපාය සංවර්ධනය සඳහා 40% ප්‍රතිලාභීදායකත්වය යටතේ ස්වයං රැකියා වල නියුතුවුවන් සහ නිරතවිමට අපේක්ෂිත කාන්තාවන් සඳහා ස්වයං රැකියා උපකරණ ලබාදීමටත් දිරිය සහන ප්‍රතිලාභීන් සඳහා වෙළඳපළ සංවර්ධනය සහ පුහුණු වැඩසටහන් පැවැත්වීමටත් රැකියා මූලික වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටත් අපේක්ෂා කෙරේ.

## 02පරිච්ඡේදය - 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්ය සාධනය

### 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

පළාත් භාණ්ඩාගාර චක්‍රලේක අංක 2022/14 හා 2022.12.30 දිනැති චක්‍රලේඛය අනුව විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල අඩංගු එන්සීපී-පීටී(එෆ්) ආකෘතියේ පරිලෝකන (ස්කෑන්) පිටපතක්(ඇමුණුම්01)

### 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

පළාත් භාණ්ඩාගාර චක්‍රලේක අංක 2023/12හා 2023.12.29 දිනැති චක්‍රලේඛය අනුව විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල අඩංගු එන්සීපී-පීටී(පී) ආකෘතියේ පරිලෝකන (ස්කෑන්) පිටපතක්. (ඇමුණුම්02)

### 3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

පළාත් භාණ්ඩාගාර චක්‍රලේක අංක 2023/12 හා 2023.12.29 දිනැති චක්‍රලේඛය අනුව විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල අඩංගු එන්සීපී-පීටී(සී) ආකෘතියේ පරිලෝකන (ස්කෑන්) පිටපතක්. (ඇමුණුම්013)

### 3.4 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

පළාත් භාණ්ඩාගාර චක්‍රලේක අංක 2023/12 හා 2023.12.29 දිනැති චක්‍රලේඛය අනුව වාර්තා කිරීමේ පදනම දැක්වෙන ආකෘතිය. (ඇමුණුම්04)

### **3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය**

රු. ,000

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද මුළු ආදායම (රු.) | එකතු කරන ලද මුළු ආදායම අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | | |
| | | | | | |

**3.6 ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ කාර්ය සාධනය**

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝජනය කරනු ලැබූ ප්‍රතිපාදනය වෙන් කරන ලද අවසාන ප්‍රතිපාදනයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදනය | | |
| **පුනරාවර්තන** | 272,288,400.00 | 263,875;136.00 | 21319,337.00 | 81% |
| **මූලධන** | 537,500,000.00 | 560,062,115.00 | 135,328,634.00 | 24% |

| වැඩසටහන් නාමය * | පුනරාවර්තන | | | වැඩසටහන් නාමය * | මූලධන | | |
|---|---|---|---|---|---|---|---|
| | 2023 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | | 2023වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම |
| | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදනය | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදනය | |
| 03 | **222,688,400**.00 | **215,361,136**.00 | **179,928,724.00** | **03** | **12,500,000.00** | 12,500,000.00 | 3,212,712.00 |
| 52 | **34,100;000.00** | **33,944,000**.00 | **28,223,583.32** | 52 | **241,000,000.00** | 242,047,775.00 | 11,506,044.00 |
| 80 | 1,000,000.00 | **940,000**.00 | 0 | **60** | **10,000,000.00** | 10,000,000.00 | 0 |
| 88 | 3,000,000.00 | **2,820,000**.00 | **1,880,000.00** | **80** | **39,700,000.00** | 56,382,116.00 | 52,325,407.00 |
| 91 | 11,500,000.00 | **10,8140,000**.00 | **6,287,031.00** | **81** | **169,000,000.00** | 173,832,224.00 | 58,536,857.00 |
| | | | | **88** | **51,300,000.00** | 51,3000,000.00 | 3,034,402.00 |
| | | | | **91** | **14,000,000.00** | 14,000,000.00 | 6,713,212.00 |
| | | | | **91(08)** | **14,000,000.00** | 0 | 6,713,211.65 |

- වාර්ෂික මුදල් ප්‍රකාශයේ පිටු අංක **XIV** හි වර්ගීකරණය අනුව.

**3.**7 **ප.මු.රී 140 ප්‍රකාරව,වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේනතු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන**

රු. ,000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝනය කර ගන්නා ලද ප්‍රතිපාදන, වෙන් කර දුන් අවසාන ප්‍රතිපාදනයේ % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 1 | පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලය | ආගමික කටයුතු හා විශේෂ ව්‍යාපෘ | 51,839,779.44 | 51,839,779.44 | 48,147,858.20 | 92% |

3.8 මුල්‍ය නොවන වත්කම් වාර්තා කිරිමේ කාර්ය සාධනය

| වත්කම් කේතය | කේත විස්තරය | 2023.01.01 දින සිට 2023.12.31 දින දක්වා වැය විෂයට ගිණුම් ගතවූ ශේෂය | 2023.01.01 දින සිට 2023.12.31 දින දක්වා වත්කම් කළමනාකරණ මෘදුකාංගයට ඇතුලත් කල ශේෂය | 2023.12.31 දිනට වියදම් ලෙස ගිණුම් ගත උවද වත්කමක් ලෙස වාර්තා නොවූ ශේෂය (වත්කම් කළ. මෘදුකාංගයට ඇතුලත් නොවූ වටිනාකම) | වත්කම් අත්පත් කර ගැනීම සඳහා දරණ ලද වියදම වත්කම් කළ. මෘදු. හරහා වාර්තා කිරීමේ ප්‍රගතිය % ලෙස |
|---|---|---|---|---|---|
| 2101 | වාහන | | | - | 100% |
| 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 4,427,596.00 | 4,427,596.00 | | |
| 2103 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | | | | |
| 2104 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | | - | - | - |
| 2105 | ඉඩම් අත්පත් කර ගැනීම | | | | |
| 2106 | වෙනත් මූලධන වත්කම් | | | | |
| 2107 | යටිතල පහසුකම් වත්කම් | 16,439,857.00 | - | - | - |
| 2108 | කල්බදු ක්‍රමය යටතේ වාහන මිලදී ගැනීම | | | | |
| 2109 | අස්පෘශ්‍ය වත්කම් | | | | |

### 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව පරිලෝකනය (SCAN) කොට මෙහි අන්තර්ගත කළ යුතුය. (ඇමුණුම්05)

## 04 **පරිච්ඡේදය** - කාර්ය සාධන දර්ශක

### ආයතනයේ කාර්යය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| ආයතනයේ කාර්ය සාධන දර්ශක | වර්ෂය තුළ සත්‍ය නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස | | |
|---|---|---|---|
| | 100% - 90% | 89% - 75% | **74**% - **50**% |
| **අච්ඡේද ව්‍යාපෘති** | | | |
| **අධ්‍යාපන** | | | |
| අලුත්වැඩියා කරන ලද පාසල් ගොඩනැගිලි, කළාප කාර්යාල ගොඩනැගිලි ගණන | 100% | - | - |
| යටිතල පහසුකම් සංවර්ධනය කරන ලද පාසල් ගණන (තාප්ප, ගේට්ටු, කාණු පද්ධති, විදුලිය) | 100% | - | - |
| සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කරන ලද පාසල් ගණන | 95% | - | - |
| ඉදිකරන ලද පාසල් ගොඩනැගිලි ගණන | 100% | - | - |
| අලුත්වැඩියාව කරන ලද ගුරු නිවාස ගණන | 95% | - | - |
| අමාත්‍යාංශීය කටයුතු | | | |
| අලුත්වැඩියා කරන ලද නිල නිවාස ගණන | 100% | - | - |
| | | | |
| **නව ව්‍යාපෘති** | | | |
| **අධ්‍යාපන** | | | |
| ඉදිකරන ලද ගොඩනැගිලි සංඛ්‍යාව | 100% | | |

| | | | |
|---|---|---|---|
| **සංචාරක** | | | |
| සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා නිර්මාණය කරන ලද වීඩියෝ දර්ශන ගණන | 100% | | |
| **සංස්කෘතික හා ආගමික කටයුතු** | | | |
| පැවැත්වූ ආගමික උත්සව ගණන | 100% | | |

## <u>අත්පත් කර ගන්නා ලද කාර්ය සාධන දර්ශක පිළිබඳ කෙටි හැඳින්වීමක්</u>

වර්ෂය ආරම්භයේදී පළාත් අයවැය ප්‍රකාශය මගින් වෙන්කළ ප්‍රතිපාදන සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්පූර්ණයෙන්ම අත්හිටවූ අතර වර්ෂය අවසානයේදී ප්‍රමුඛතාවය මත ප්‍රතිපාදන සුලු ප්‍රමාණයක් ලබා දෙන ලදී. ඒ අනුව අධ්‍යාපන සේවා සඳහා රු.මි. 60ක් වෙන් වූ අතර ඉන් රු.මි. ක් වැය කරන ලදී.අතැති බිල්පත් සහ අවිච්ඡේද ව්‍යාපෘති සඳහා රු.මි. 41.11 ක් වැය කර ඇත. නව ව්‍යාපෘති වල භෞතික ප්‍රගතිය 96%ක් වන අතර හා මූල්‍ය ප්‍රගතිය 89%කි.

අමාත්‍යාංශීය කටයුතු සඳහා රු.මි. 2ක් වෙන්කළ අතර වැයකල මුදල රු.මි. 1.8 කි. භෞතික ප්‍රගතිය 100%ක් වන අතර මූල්‍ය ප්‍රගතිය 89%කි.

සංචාරක සංරචකය සඳහා රු.මි. 0.65 ක් වෙන්කළ අතර වැයකළ මුදල රු.මි.0.637 කි. භෞතික ප්‍රගතිය 100%ක් වන අතර අතර මූල්‍ය ප්‍රගතිය 96%කි.

සංස්කෘතික හා ආගමික කටයුතු සඳහා රු.මි. 1.5ක් වෙන්කළ අතර වැයකළ මුදල රු.මි.1.44 කි. භෞතික ප්‍රගතිය 100%ක් වන අතර අතර මූල්‍ය ප්‍රගතිය 95%කි.

2023 වර්ෂයේ සංවර්ධන වැඩසටහන් සඳහා ලැබුණු මුළු ප්‍රතිපාදන වලින් අතැති බිල්පත් සහ අවිච්ඡේද ව්‍යාපෘති සහ ක්‍රියාත්මක කරන ලද අතර සීමිත නව ව්‍යාපෘති සඳහා වැයකල ප්‍රමාණය 68%කි. එමෙන්ම රටේ ආර්ථික අර්බුදකාරී තත්ත්වයක් පැවැතියත් සංවර්ධන කටයුතු අපහසුවකින් තොරව ඉටු කර ගැනීමට හැකිවීමෙන් සැලසුම් කළ පරිදි ඉලක්ක සපුරා ගැනීමට හැකි විය.

05. පරිච්ඡේදය තිරසර සංවර්ධන අරමුණු -(SDG) සපුරා ගැනීමේ කාර්යය සාධනය

5.1 හදුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු දක්වන්න

| අදාළ ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණට ළඟාවීම සඳහා ආයතනය සැලසුම් කළ ඉලක්ක | එම ඉලක්කය ලඟා කර ගැනීමට ආයතනය අරමුණු කළ සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් වර්ෂය 2023 තුළ ඉටුකළ කාර්යය | එම දර්ශක අනුව 2023 වර්ෂය තුළ ලබාගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% -49% | 50%-74% | 75%-100% |
| පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම | උතුරු මැද පළාතේ දරුවන්ට නිදහස්, සමාන සහ ගුණාත්මකභාවයෙන් ඉහළ ප්‍රාථමික සහ ද්විතියික අධ්‍යාපනයක් ලබාදීම. | ඉහළ ගුණාත්මක ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන පහසුකම් පුළුල් කිරීමටත්, සිසුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමටත්, සිසුන්ගේ මානසික හා ශාරීරික සෞඛ්‍ය තත්ත්වයන් දියුණු කිරීමටත්, දැනුම කුසලතා හා ආකල්ප සංවර්ධනය කිරීමටත් අවශ්‍ය කටයුතු සිදුකිරීම | පාසල් 9ක පන්ති කාමර ගොඩනැගිලි ඉදිකිරීම | | | 100% |
| | | | පාසල් ක5පන්ති කාමර ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම සහ කලාප කාර්යාල ක් අලුත්වැඩියා 01 කිරීම | | | 100% |
| | | | ගුරු නිවාස 3ක් අලුත්වැඩියා කිරීම | | | 95% |
| | | | පාසල් 11ක සනීපාරක්ෂක පහසුකම් , වැඩිදියුණු කිරීම | | | 95% |
| | | | පාසල් 8ක යටිතල පහසුකම් හා වෙනත් පහසුකම් වැඩිදියුණු කිරීම | | | 100% |
| | | | කැකිරාව කළාප කාර්යායේ ගොඩනැගිලි අලුත්වැඩියාව | 25% | | 100% |
| | | | කැබිතිගොල්ලෑව ප්‍රාථමික විද්‍යාලයේ 90x25 දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 25% | | 100% |

| අදාළ ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණට ළඟාවීම සඳහා ආයතනය සැලසුම් කළ ඉලක්ක | එම ඉලක්කය ලඟා කර ගැනීමට ආයතනය අරමුණු කළ සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් වර්ෂය තුළ 2023 ඉටුකළ කාර්යය | එම දර්ශක අනුව 2023 වර්ෂය තුළ ලබාගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% -49% | 50%-74% | 75%-100% |
| නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම | පරිසර හිතකාමීව සහ සංස්කෘතික හිතකාමීව සංචාරක කර්මාන්තය ගොඩනැගීම | පළාතේ සංචාරක ආකර්ශණය ශක්තිමත් කිරීම | සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා වීඩියෝ දර්ශන නිර්මාණය කිරීම | | | 100% |
| බපබ බනගර සහ ජනාවාස පරිපූර්ණ ආරක්ෂිත සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම | පළාතේ ජනතාවගේ සහ දරුවන්ගේ අධ්‍යාත්මික සංවර්ධනය | සාරධර්ම වලින් පිරිපුන් සමාජයක් ගොඩනැගීම | පළාතේ විහාරස්ථානවල ආගමික උත්සව සිදුකිරීම | | | 100% |

## 5.2 තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

රටේ පැවැති දුෂ්කර ආර්ථික තත්ත්වයක් හේතුවෙන් නව සංවර්ධන ව්‍යාපෘති සඳහා ලබාදුන් ප්‍රතිපාදන ප්‍රමාණය අවම වුවද ලබාදුන් මුදල් ප්‍රමාණය අනුව සංවර්ධන ව්‍යාපෘති සාර්ථකව නිම කර ගැනීමට හැකියාව ලැබුණි. විශේෂයෙන්ම පළාතේ දරු දැරියන්ට පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම පිණිස අධ්‍යාපන අංශයේ සංවර්ධනය සඳහා පැවැති භෞතික මෙන්ම මානව සම්පත් අවශ්‍යතා මෙම වර්ෂය තුළ දී සැලකිය යුතු මට්ටමකින් සම්පූර්ණ කර ගැනීමට නොහැකි විය. මෙයට හේතු වූයේ ප්‍රතිපාදන සීමා කිරීමය. 2022 වර්ෂයේ අවිච්ඡේද හා අතැති බල්පත් සඳහා ගෙවීම් කිරීමට සීමිත ප්‍රතිපාදන ප්‍රමාණයක් 2023 වර්ෂයේදී ලබාදීම සිදුවිය. ඒ යටතේ පාසල් ගොඩනැගිලි, පන්ති කාමර අවශ්‍යතා, ගුරු නිවාස, ප්‍රධාන පාසල් සංවර්ධනය, සනීපාරක්ෂක පහසුකම්, යටිතල පහසුකම් ආදී පාසල් පද්ධතියේ සංවර්ධනය උදෙසා භෞතික අවශ්‍යතා මෙන්ම මානව සම්පත් සංවර්ධන අවශ්‍යතා සම්පූර්ණ කිරීමට හැකි විය. අධ්‍යාපනයේ භෞතික සම්පත් සංවර්ධනයට අමතරව අ.පො.ස සාමාන්‍ය පෙළ, උසස් පෙළ ප්‍රතිඵල ඉහල නැංවීමේ ව්‍යාපාති, දෙමව්පියන් දැනුවත් කිරීමේ වැඩසටහන් ගණනාවක් ගරු ආණ්ඩුකාරතුමාගේ මග පෙන්වීම යටතේ ක්‍රියාත්මක කරන ලදී.

අ/කැබිතිගොල්ලෑව ප්‍රාථමික විද්‍යාලයේ දෙමහල් ගොඩනැගිල්ලේ වැඩ නිම කර සිසු අයිතියට පත්කිරීම.





















## පො/නුවරගල විද්‍යාලයේ ප්‍රධාන ශාලාව විදුලි පරිපථ කිරීම සහ විදුලි සම්බන්ධතාවය ලබාදීම








ලයේ [illegible]








**අ/කැකි/කිතුල්හිටියාව ප්‍රාථමික විද්‍යාලයේ වැසිකිළි පද්ධතියක් ඉදිකිරීම.**











අ/ සුබෝධි මහා විද්‍යාලය සඳහා ජල කුළුණක් ඉදිකිරීම



**මීට අමතරව අ.පො.ස. (සාමාන්‍ය පෙළ, උසස් පෙළ) ප්‍රතිඵල ඉහල නැංවීමේ විශේෂ ව්‍යාපෘතිය යටතේ පැවැත්වූ විදුහල්පතිවරු, ගුරුවරුන් සහ දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන්**

















06 පැතිකඩ

**6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය**

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත) |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 10 | 05 | 05 |
| තෘතියික | 02 | 02 | - |
| ද්විතියික | 82 | 59 | 23 |
| ප්‍රාථමික | 14 | 13 | 1 |

**6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.**

**6.3 මානව සම්පත් සංවර්ධනය**

| වැඩසටහනේ නම | **පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව** | **වැඩ සටහනේ කාල සීමාව** (දින/ මාස/ අවු.) | **සමස්ත ආයෝජනය (Rs'000)** | | **වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)** | **නිමවුම / ලබා ගත් දැනුම*** |
|---|---|---|---|---|---|---|
| | | | **දේශීය** | **විදේශීය** | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

*ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වූයේ කෙසේද? යන්න කෙටියන් පැහැදිලි කරන්න.

දැනට මෙම අමාත්‍යාංශය මඟින් පුහුණු වැඩසටහන් නොපැවැත්වේ. ආයතනයේ නිළධාරීන් උදෙසා අවශ්‍ය වන පුහුණු, පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකය මඟින් සිදු කරනු ලබයි.

**04 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව**

| අංකය | අදළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සදහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **පහත සදහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේද?** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අනුකූල නොවේ | මෙම ගිණුම් අමාත්‍යාංශයට අදාල නොවේ | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අනුකූල නොවේ | මෙම ගිණුම් අමාත්‍යාංශයට අදාල නොවේ | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අනුකූල නොවේ | මෙම ගිණුම් අමාත්‍යාංශයට අදාල නොවේ | |
| 1.6 | වෙනත් ගිණුම් | අනුකූල වේ | | |
| | | | | |
| 2 | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (ප.මු.රී 321)** | | | |
| 2.1 | පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ 2014/14 හා 2016/10 අනුව ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.2 | පුද්ගලික පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට පළාත් භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම (ප.ස 37 පෝරමය) | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (ප.ස 32 පෝරමය) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| | | | | |
| 3 | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (ප.මු.රී 83)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා සිදුවන පරිදී බලතල පවරා දී | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | තිබීම | | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 3.5 | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් 2022.11.23 දිනැතිව නිකුත් කර ඇති අංක 04/2022 චක්‍රලේඛය හා 2023.01.05 දිනැතිව පළාත් භාණ්ඩාගාර විසින් නිකුත් කර ඇති NCP/CS/PT/ICTO/GPS දරන ලිපියට අනුකූලව GPS මෘදුකාංගය හරහා වැටුප් සකස් කිරීම | අනුකූල වේ | | |
| | | | | |
| 4 | <u>**වාර්ෂික සැලසුම් සකස් කිරීම**</u> | | | |
| 4.1 | නියමිත දිනට වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | නියමිත දිනට වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | නියමිත දිනට වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | නියමිත දිනට වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට පළාත් අයවැය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | නියමිත දිනට වාර්ෂික අග්‍රිම සීමා වාර්තාව පළාත් භාණ්ඩාගාර ගිණුම් හා ගෙවීම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| | | | | |

| | | | | |
|---|---|---|---|---|
| 5 | **<u>විගණන විමසුම්</u>** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දීම | අනුකූල වේ | | |
| | | | | |
| 6 | **<u>අභ්‍යන්තර විගණනය</u>** | | | |
| 6.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, වසර ආරම්භයේ දී අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුල පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| | | | | |
| 7 | **<u>විගණන හා කළමණාකරණ කමිටු</u>** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වා තිබිම | අනුකූල වේ | | |
| | | | | |
| 8 | **<u>වත්කම් කළමනාකරණය</u>** | | | |
| 8.1 | පළාත් සභාව සතු වත්කම් කළමනාකරණය සම්බන්ධ පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 2014/14 හා 2016/10 අනුව වත්කම් මිලදී ගැනීම, නිකුත් කිරීම හා අපහරණය කිරීම පිළිබඳ කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | කොන්ට්‍රෝල ජනරාල්ගේ අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | වාර්තා කර තිබීම | | | |
| 8.3 | පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 2022/08 අනුව, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්තය, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරිම ප.මු.රී 490 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| 8.6 | කොම්ප්ට්‍රෝලර් ජනරාල්ගේ 2022.09.09 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 10/2022 ප්‍රකාරව ආයතනයේ එකත් වී ඇති අබලි ද්‍රව්‍ය බැහැර කර තිබීම | අනුකූල වේ | | |
| | | | | |
| 9 | <u>**වාහන කළමනාකරණය**</u> | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම ප.මු.රී 54 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | ප්‍රධාන ලේකම්ගේ NCP/CP/FD/08 හා 2017.08.08 දිනැති ලිපිය ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරික්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | | | | |
| 10 | <u>බැංකු ගිණුම් කළමනාකරණය</u> | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසදුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසදුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් පළාත් මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| | | | | |
| 11 | <u>ප්‍රතිපාදන උපයෝජනය</u> | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | ප.මු.රී. 46 ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදී බැරකම් වලට එළඹීම | අනුකූල වේ | | |
| | | | | |
| 12 | <u>රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්</u> | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන<br><br>හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| | | | | |
| 13 | <u>පොදු තැන්පත් ගිණුම</u> | | | |
| 13.1 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | | | | |
| 13.2 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 572 අනුව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| | | | | |
| 14 | **<u>අග්‍රිම ගිණුම</u>** | | | |
| 14.1 | ප.මු.රී. 259 අනුව සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය පළාත් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | ප.මු.රී. 261 ප්‍රකාරව, නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාරයය අවසන් වී සතියක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | ප.මු.රී. 261 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| | | | | |
| 15 | **<u>ආදායම් ගිණුම</u>** | | | |
| 15.1 | ප.මු.රි.133 ට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල වේ | | |
| 15.2 | රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට රැස් කරනු ලබන අවස්ථාවේම ඍජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | | | | |
| 15.3 | ප.මූ.රී. 116 අනුව හිග ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| | | | | |
| 16 | **<u>මානව සම්පත් කළමනාකරණය</u>** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ පවත්වාගෙන යාම හා වැටුප් ගෙවීම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| | | | | |
| 17 | **<u>මහජනයා වෙත තොරතුරු ලබා දීම</u>** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා හෝ ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | | | | |
| 17.3 | තොරතුරු දැනගැනීමේ පනතේ 08වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| | | | | |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018 (I) දරණ රාජ්‍ය පරිපාලන හා කළමණාකරන අමාත්‍යංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| | | | | |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල වේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ | | |
| | | | | |
| 20 | <u>විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම</u> | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |